02



# ඊමාන් හා අමල්



ඉස්ලාම් පවසන කරුණු විශ්වාස කිරීම "ඊමාන්" ලෙසත් එහි දේශනා පිළිපැදීම "අමල්" ලෙසත් සැලකේ. ඊමාන් යනු හදවතින් ම පිළිගෙන මුවින් ප්‍රකාශ කර ක්‍රියාවෙන් ස්ථිර කිරීම වේ. යමෙක් ඉස්ලාමීය විශ්වාස පිළිගෙන, ඒ තුළින් අමල් ඉටු කරන්නේ නම්, ඔහු "මුඃමින්" ලෙස හඳුන්වනු ලබයි. ඊමාන් හා අමල්, මලත් සුවඳත් මෙන් බැඳී පවතී. ඊමානයෙන් තොර ව සිදු කරනු ලබන කිසිදු අමලයක් පිළිගනු නොලැබේ. අල් කුර්ආනයෙහි ඊමාන් හා අමල් එකට එක් කර ස්ථාන 70ක පමණ සඳහන් කර තිබීමෙන් මෙය ස්ථිර කරනු ලැබේ.

**"නබිවරයාණෙනි, කවරෙක් ඊමාන් කර සාලිහ් වන ක්‍රියාවන් කරන්නේ ද ඔවුන්ට නියත වශයෙන් ම ස්වර්ගය ඇත. ඒවායෙහි ගලා යන දිය ගංගාවන් තිබෙන බවට සුභාරංචි පවසන්න. (2:25)**

**පුරුෂයකු හෝ වේවා ස්ත්‍රියක හෝ වේවා, විශ්වාස කර යහ ක්‍රියාවන් කවරෙකු සිදු කළ ද නියත වශයෙන් ම අපි ඔවුන්ව යහ ජීවිතයක් ගත කිරීමට සලස්වන්නෙමු." (16.97)**

"ඊමාන්හි 70කට වඩා වැඩි අංශ ප්‍රමාණයක් අන්තර්ගත වේ. එහි උසස්තම අංශය "ලා ඉලාහ ඉල්ලල්ලාහ් " යන කලීමාව වන අතර එහි පහළ ම අංශය මාර්ගයේ ඇති අනතුරුදායක ද්‍රව්‍ය ඉවත් කිරීම වේ. ලැජ්ජාශීලීභාවය ද ඊමාන්හි එක් කොටසකි. " යනුවෙන් මුහම්මද් (සල්) තුමා පැවසූවේ ය. (බුහාරි)





ඉස්ලාම්, ඊමාන් කළ යුතු කරුණු පෙන්වා දී ඇති ආකාරයට අමල් ද පෙන්වා දී ඇත. නැමදුම් වතාවත්, පොදු සේවාවන්, ගනුදෙනු, යහ ගුණාංග යනාදිය අමල්හි අන්තර්ගත වේ. එම අමල් ඉටු කිරීම මගින් කෙනකුගේ ඊමානය ස්ථිර වනු ඇත.

**නුඹලාගේ මුහුණ නැගෙනහිර හෝ බස්නාහිර දෙසට හැරවීම (පමණක්) යහකම නොවේ. එහෙත් යහකම නම් අල්ලාහ් ගැන ද අවසාන දිනය ගැන ද මලක්වරුන් ගැන ද ධර්ම ග්‍රන්ථ ගැන ද නබිවරුන් ගැන ද විශ්වාස කර ඔහු (අල්ලාහ්) කෙරෙහි වූ ඇල්ම නිසා දේපළ නෑදෑයන්ට ද අනාථයන්ට ද දිළින්දන්ට ද මගීන්ට ද යාචකයන්ට ද වහලුන් මුදවා ගැනීමට ද වැය කර සලාත්හි නිරතව සකාත් ගෙවීම ද වේ. තවද ඔවුහු පොරොන්දු වූ විට තම පොරොන්දුව ඉටු කරන දුෂ්කරතාවන්හි දී ද දිළිඳු බවේ දී ද (සත්‍යය හා අසත්‍යය අතර) සටනේදී ද ඉවසිලිමත් වන්නෝ වෙති. ඔවුහු සත්‍යවාදීහු ය. තව ද බියබැතිමත් වූ අය ද ඔවුහු ම ය. (2:177)**

මෙය සුන්නාහ්වෙන් ද තහවුරු වේ.

මුඃමින්වරයකු හා කාෆිර්වරයකු අතර ඇති වෙනස සලාතය අතහැරීම වේ. (බුහාරි)

වැන්දඹුවකගේ හෝ අනාථයකුගේ අවශ්‍යතා ඉටු කිරීමට උත්සාහ කරන්නා, නොකඩවා රාත්‍රියේ සිටගෙන නැමදුම් කළ හා දිවා කාලයේ උපවාසයේ යෙදෙන්නකු මෙන් වේ. (බුහාරි)

යමෙකු තමාට ප්‍රියමනාප දේ තම සොහොයුරාට ද ප්‍රිය මනාප බව විශ්වාස නොකරන තාක් ඔහු සත්‍ය මුඃමින්වරයකු නොවේ. (බුහාරි)

කවරෙක් අල්ලාහ් හා පරමාන්න දිනය විශ්වාස කරන්නේ ද ඔහු අසල්වාසීන්ට යහපත සිදු කරත්වා! කවරෙක් අල්ලාහ්ව හා පරමාන්න දිනය විශ්වාස කරන්නේ ද ඔහු තම ආගන්තුකයාට සත්කාර කරත්වා! කවරෙක් අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නේ ද ඔහු කතා කළ හොත් යහපත කතා කරත්වා! නොමැති නම්, නිහඬව සිටිත්වා! (බුහාරි)

"මුඃමින්වරුන් අතරින් යහපත් තැනැත්තා යහගුණ ඇත්තා වේ." (අහ්මද්) අමල් නොමැති ඊමාන් පල රහිත වේ. මෙවැනි අමල් අල් කුර්ආනය මිරිඟුවක් යයි පවසයි.

අල් කුර්අනය ඊමාන් සමග අමල් එක් කර පවසන විට, "ඊමාන් කර (යහපත්) සාලිහ් වන ක්‍රියා ඉටු කරන්නන් යනුවෙන්" පවසයි "සාලිහ් වන අමල්" යන්න නියමිත කාලය තුළ කරන සුදුසු නිවැරදි ක්‍රියා ලෙස පැහැදිලි කළ හැකි ය. තව ද මෙලොව - පරලොව ජීවිතයටත්, තනි පුද්ගල-සාමූහික ජීවිතයටත් ආධ්‍යාත්මික-ලෞකික ජීවිතයටත් ගැළපෙන පරිදි සකස් වන සියලු ම ක්‍රියා සාලිහ් වන අමල් ලෙස විස්තර කළ හැකි ය.

සාලිහ් වන 'අමල්' එකක් අල්ලාහ් පිළිගැනීමට නම් චිත්ත පාරිශුද්ධිය වැදගත් කොන්දේසියකි.

"වරක් සහාබිවරයෙක් අල්ලාහ්ගේ ධර්ම දූතයා අසලට පැමිණ "අල්ලාහ්ගේ ධර්ම දූතයාණෙනි! අල්ලාහ් වෙනුවෙන් මම අමල් කිහිපයක් ඉටු කරන්නෙමි. ඒ සමග ම ජනයා මගේ ක්‍රියා දෙස බලන විට මා හට සතුටක් ඇතිවෙනවා" යැයි පැවසුවේ ය. මුහම්මද් (සල්) තුමාණෝ කිසිදු පිළිතුරක් නොදුන්හ. එවිට පහත සඳහන් අල් කුර්ආන් වාක්‍යය පහළ විය. "යමෙක් තම දෙවියන් හමු වීමට ප්‍රිය කරන්නේ ද ඔහු යහ ක්‍රියා කර තම දෙවියන් කිසිවකු සම නොකර (ඔහු ම) නමදින්න" (18:110)

මුඃමින්වරයකුගේ ක්‍රියාකාරීත්වය හා මුඃමින් නොවන කෙනකුගේ ක්‍රියාකාරීත්වය අතර වෙනසක් ඇත. මුඃමින්වරයකුගේ ක්‍රියාකාරීත්වය පහත සඳහන් කොන්දේසිවලට ඇතුළත් වේ.

01. අල්ලාහ්ට හා ඔහුගේ දූතයාට යටහත් ව සිටීම.
02. අල්ලාහ්ගේ තෘප්තිය බලාපොරොත්තුවෙන් සිටීම.
03. අල්ලාහ්ගෙන් පමණක් ප්‍රතිඵලය බලාපොරොත්තුවෙන් සිටීම.
04. මුහම්මද් (සල්) තුමාගේ මගපෙන්වීම පිළිපැද සිටීම.

ඊමාන් කළ ජනතාවගේ පිවිතුරු ධෛර්යය මුසු වූ ක්‍රියාකාරීත්වය ඉස්ලාමීය ඉතිහාසය පුරා ම දක්නට හැකි ය. මුඃමින්වරයකුගේ එක ම අරමුණ වන්නේ අල්ලාහ්ගේ තෘප්තිය ලබා ගැනීම වේ, යන්නට යහපත් පූර්වාදර්ශයක් ලෙස පහත සඳහන් සිදුවීම දැක්විය හැකි ය.

යුධ පිටියේ දී අලි (රළි) තුමා සතුරා සමග සටන් කරමින් සිටියේ ය. සතුරා දුර්වල වන අවස්ථාවේ දී ඔහු අලි (රළි) තුමාගේ මුහුණට උගුර පාරා කෙළ ගැසුවේ ය. එක වර ම, අලි (රළි) තුමා ඔහුව එම ස්ථානයේ දී අතහැර වෙනෙකකු වෙත ගියේ ය. මෙය දැක විස්මයට පත් වූ ඔහු ඉක්මනින් ලුහුබැඳ ගොස් "මාව එලෙස අතහැර පැමිණියේ මක්නිසාද?" කියා විමසුවේ ය. එවිට එතුමා "නුඹ දෙවියන්ගේ සතුරකු බැවින් නුඹ ව ඝාතනය කර දැමීමට උත්සාහ කළෙමි. නමුදු, නුඹ උගුර පාදා කෙළ ගැසූවිට මගේ සතුරකු බවට පත් වුණි. මෙම තත්ත්වයේ දී මා නුඹ ඝාතනය කළේ නම් එය ආත්මාර්ථකාමී ඝාතනයක් බවට පත් වේ. අල්ලාහ්ගේ කුසල් අහිමි ව යයි. එහෙයින්, මම නුඹ ව අතහැරියෙමි " යනුවෙන් පිළිතුරු දුන්නේ ය.

එම නිසා අපගේ මුතුන්මිත්තන්ගේ මෙවැනි ආදර්ශය පිළිපැද අපි ද අපගේ ඊමානය ශක්තිමත් කර ගනිමු.

**අභ්‍යාස**

01. ඊමානය හා අමල් අතර ඇති සබැඳියාව පහදන්න.

02. අල් කුර්ආනයේ 18:110 වන වාක්‍යය පහළ වීමට හේතු වූ සිදුවීම කුමක් ද?

03. යහ ක්‍රියා ඉටු කිරීමෙහි ලා මුඃමින්වරයකු හා මුඃමින්නොවන්නෙකු අතර වෙනස වගුගත කරන්න.

04. "සාලිහ් වන අමල්" යන්නෙන් ඔබ වටහාගත් දේ කුමක් ද?

05. පාඩමේ සඳහන් වන අල් කුර්ආන්, හදීස් මගින් පෙන්වා දෙන යහ ගුණාංග ලැයිස්තු ගත කරන්න.